**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2017)

## ජාතික කියවීමේ මාසය - 2017 ඔක්තෝබර්

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය උපදේශක චක්‍රලේඛ 2004/මස/සේ(අ) (සංශෝධිත 2017) විශ්වවිද්‍යාල පුස්තකාලවල, ජාතික කියවීමේ මාසය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

### 1. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති අතර, 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසය වෙනුවෙන් කියවීම් ප්‍රවර්ධනය සඳහා විශේෂ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන මෙන් සියලුම විශ්වවිද්‍යාල පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. සිසුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමත්, පුස්තකාල සම්පත් හා සේවාවන් ප්‍රවර්ධනය කිරීමත් මෙම වැඩසටහන්වල අරමුණු විය යුතු වේ.

### 02. කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුව

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය.

### 03. ක්‍රියාත්මක කිරීමට සුදුසු වැඩසටහන්

- බැනර්/උධෘත පාඨ හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම (කියවීමේ අගය ගම්‍ය වන පරිදි)
- සමරු කලාප, සඟරා එළිදැක්වීම
- පුස්තකාලය පිළිබඳව වීඩියෝ පටයක් නිර්මාණය කිරීම
- පුස්තකාල වෙබ් අඩවිය නිර්මාණය කිරීම
- ආචාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සඳහා දත්ත පදනම් අත්පත් කර ගැනීම
- අරමුදල් රැස්කිරීම, පොත් මිලට ගැනීම හා පරිත්‍යාග ලබා ගැනීම, පරිත්‍යාග ලබාදීම වැනි කටයුතු හා උපකරණ අලුතින් ලබා ගැනීම
- සම්මන්ත්‍රණ හා දේශන සංවිධානය කිරීම
- අන්තර්ජාලය හරහා තොරතුරු ගවේෂණයට හුරු කරවීමේ වැඩසටහන් පැවැත්වීම
- අන්තර්ජාල සේවා පිළිබඳ වැඩමුළු/සම්මන්ත්‍රණ/දේශන සංවිධානය කිරීම
- චිත්‍රපට හා වීඩියෝ දර්ශන ආදී විවිධ විනෝදජනක වැඩසටහන් මගින් කියවීමේ රුචිය වර්ධනය කරලීම
- පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ වැඩසටහන් දියත් කිරීම
- පාඨක අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම
- කියවීමේ රුචිය පිළිබඳ පාඨක සමීක්ෂණ පැවැත්වීම
- විශ්වවිද්‍යාල පුස්තකාල අතර සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 04. ඇගයීම

සිදු කරන ලද වැඩසටහන් පිළිබඳ වාර්තාවක්, ඡායාරූප/සංයුක්ත තැටි හා වෙනත් සාධක සහිතව ***2018 ජනවාරි* මස 01** වන දිනට පෙර ලැබෙන සේ ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා, ජාතික පුස්තකාලය, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට*** යොමු කළ යුතුය.

හොඳම වැඩසටහන් ඉටුකළ පුස්තකාල වෙත 2018 ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ.

ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ
සභාපති

**ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ**
සභාපති
**ජාතික පුස්තකාල** හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07.

විමසීම් - අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය
දුරකථන අංකය - 0112-698847, 0112-674387
ෆැක්ස් අංකය - 0112-685201, 0112-674387
වෙබ් අඩවිය - www.natlib.lk